## ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය මට්ටමින් ගැටලු විසඳීමේ කමිටුව

01. ව්‍යාපෘති අධ්‍යක්ෂ (සභාපති)
02. ප්‍රාදේශීය ලේකම්වරුන්
03. ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ නිලධාරී,පරිසර නිලධාරී
04. අදාල ව්‍යාපෘති පාර්ශවකරුවන් හා අදාල අනෙකුත් රේඛීය ආයතනවල නියෝජිතයින් (අවශ්‍යතාවය මත සහභාගීත්වය සඳහා දැනුම්දෙනු ඇත.)

ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ඉල්ලීම මත ව්‍යාපෘති බල ප්‍රදේශයේ ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම්වරුන් මෙම ගැටලු විසඳීමේ කමිටුවට සහභාගී වී අවශ්‍ය විසඳුම් ලබාදීමට මැදිහත් වේ.

## වැඩසටහන් කළමනාකරණ ඒකකය මට්ටමින් ගැටලු විසඳීමේ කමිටුව

01. වැඩසටහන් අධ්‍යක්ෂ (සභාපති)
02. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්
03. අදාල දිස්ත්‍රික් ලේකම්
04. නැවත පදිංචි කිරීමේ විශේෂඥ හා පරිසර විශේෂඥ

අමාත්‍යංශ ලේකම්ගේ උපදෙස් මත මෙම ගැටලු විසඳීමේ කමිටුව රැස්වී විසඳුම් ලබාදේ. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති තුනෙහි අධ්‍යක්ෂකවරුන් මෙම කමිටුවට සහභාගී වී විසඳුම් ලබාගැනීමට අවශ්‍ය කරුණු ඉදිරිපත් කරනු ලබයි. අවශ්‍යතාවය මත ව්‍යාපෘති පාර්ශවකරුවන්ට හා අදාල අනෙකුත් රේඛීය ආයතනවල නියෝජිතයින්ට සහභාගීත්වය සඳහා දැනුම්දෙනු ඇත.

## ගැටලු ලේඛනය

සියලුම පැමිණිලි හා ඒවා විසඳීමට ගන්නා ලද සියලුම ක්‍රියාමාර්ග "ගැටලු ලේඛනය" නම් වූ ලේඛනයක සටහන් කරනු ලබයි. මෙම ලේඛන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථානගත කෙරේ.

### විසඳුමට කැපවීම

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන මඟින් පීඩාවට පත් වන සියලුම ප්‍රජාවට විසඳුම් ලබාදේ. මෙම ව්‍යාපෘතියේ ඉතාම වැදගත්ම සාධකය ප්‍රජාවවන අතර ප්‍රජාවගේ ගැටලු විසඳීමට වැඩසටහන කැප වී සිටී.




## වැඩිදුර තොරතුරු සඳහා

- **මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය -**
  ව්‍යපෘති අධ්‍යක්ෂ,මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය,
  ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල පරිශ්‍රය,
  හසලක.දුරකථන අංකය: 055-2258977
  ඊ-මේල්: mlbcrp.mwsip@gmail.com

- **ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය**
  ව්‍යාපෘති අධ්‍යක්ෂ, ඉහළ ඇලහැර ඇළ ව්‍යාපෘතිය,
  ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මඩාටුගම.
  දුරකථන අංකය: 025-2054896
  ඊ-මේල්: uecp.mwsip@gmail.com

- **වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය**
  ව්‍යාපෘති අධ්‍යක්ෂ,වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය,
  වාරිමාර්ග දෙපාර්තමේන්තුව, නුවර පාර, කුරුණෑගල.
  දුරකථන අංකය: 037- 2231111
  ඊ-මේල්: nwpcp.mwsip@gmail.com

- **මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (ප්‍රධාන කාර්යාලය)**
  නැවත පදිංචි කිරීමේ විශේෂඥ හෝ පරිසර විශේෂඥ
  මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන,
  වැඩසටහන් කළමනාකරණ ඒකකය,
  අංක 493/1/1, ටී.බී. ජයා මාවත, කොළඹ 10.
  දුරකථන අංකය: 0112675810
  ඊ-මේල්: pdadbproject@gmail.com

**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය**

MWSIP Leaflet No.03: September, 2016

## ගැටලු විසඳීමේ ක්‍රමවේදය

# ව්‍යාපෘතියේ බලපෑම ගැන ගැටලු ඉදිරිපත් කළ යුත්තේ කෙසේද කාටද



**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය**

MWSIP

# මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන

එක්දහස් නවසිය හැටේ දශකයේ ආරම්භකර විවිධ අදියරයන් යටතේ ක්‍රියාත්මක කරනලද මහවැලි මහා සැලැස්ම ප්‍රකාරව යෝජිතව තිබූ බොහෝ ව්‍යාපෘති, මේ වනවිට ක්‍රියාත්මක කර එහි ප්‍රතිලාභ ජනතාව අතරට පත්වෙමින් තිබේ. **මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනද** මහවැලි සංවර්ධන වැඩපිළිවෙලෙහි අවසන් අදියරයට යෝජිත වූ ප්‍රධාන වැඩසටහනකි.

මෙමඟින් දැනට ඉදි කරමින් පවත්නා “මොරගහකන්ද - කළුගඟ” ජලාශවලින් හා යාබද ගංගා ද්‍රෝණිවලින් ලැබෙන්නා වූ අතිරික්ත ජල සම්පත, උතුරුමැද හා වයඹ පළාත්වලට ලබාදීමට සැලසුම්කර ඇත. දැනට දෙකන්නයේ වගා කටයුතු කිරීමට නොහැකිව උග්‍ර වාරි ජල හිඟයෙන් හා පානීය ජල හිඟයෙන් පීඩාවිඳින එකී පළාත්වල ජනතාවගේ මූලික ජල අවශ්‍යතා සපුරා ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම වැඩසටහනේ මූලික අපේක්ෂාව වේ.

**ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය** එක්ව සපයන රුපියල් බිලියන 90ක මූල්‍ය පහසුකමක් යටතේ මෙම ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැළසුම්කර ඇත. වැඩසටහනේ පළමු අදියර යටතේ ප්‍රධාන ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කරනු ලැබේ. එනම්,

- **මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය**
- **ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය**
- **වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය**

## ගැටලු විසඳීමේ යාන්ත්‍රණය

ගැටලු විසඳීමේ යාන්ත්‍රණය යනු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම නිසා බලපෑමට ලක්වන ප්‍රජාවට, එම මුහුණදෙන ගැටලු ඉදිරිපත් කොට ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට ඇති මාර්ගයකි. පීඩාවට පත් වූ ඕනෑම පුද්ගලයෙකුට මෙම යාන්ත්‍රණය තුළ හඳුන්වාදී ඇති ක්‍රමවේදය අනුගමනයකර කිසිඳු වියදමකින් තොරව විසඳුම් ලබාගත හැකිය.




### ගැටලු විසඳීමේ ක්‍රමවේදය මඟින් විසඳුම් ලබාගත හැකි අංශ

- ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටලු
- වන්දි ගෙවීමේ ක්‍රමවේදය පිළිබඳව තොරතුරු
- නැවත පදිංචි කිරීමේදී ඇති වන ගැටලු
- ඉඩම් අයිතිය සම්බන්ධ ගැටලු
- වන්දි ගෙවීම් ප්‍රමාද වීම
- ප්‍රතිසංස්කරණ සහයෝගිතා වැසටහන
- ව්‍යාපෘතිය හා සම්බන්ධ සමාජ හා පාරිසරික ගැටලු
- ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධ ගැටලු

### ගැටලු විසඳීමේ ක්‍රමවේදය මඟින් විසඳුම් ලබා ගත නොහැකි අංශ

- උසාවියෙන් විසඳුම් ලබා ගැනීමට අපේක්ෂිත හා උසාවියට යොමු කර ඇති ගැටලු
- ලබා දීමට යෝජිත වන්දි ප්‍රමාණය තීරණය කිරීම

## ගැටලු යොමු කිරීමේ ක්‍රමවේදය

ගැටලු විසඳීම සඳහා ව්‍යාපෘතිය මඟින් ගැටලු විසඳීමේ කමිටු පිහිටුවා ඇත. ගැටලුව වාචිකව හෝ ලිඛිතව ග්‍රාම නිලධාරී, ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ නිලධාරී හෝ පරිසර නිලධාරී වෙත පළමුව ඉදිරිපත් කළ යුතු අතර එයට අදාල පෝරමය /ආකෘති පත්‍රය (GRC-A) එම නිලධාරීන්ගේ කාර්යාල වලින් ලබාගත හැකිය. එලෙස ඉදිරිපත් කරන ගැටලු එම නිලධාරීන් විසින් අදාල ගැටලු විසඳීමේ කමිටු වෙත ඉදිරිපත් කර විසඳුම් ලබාදේ.

## ගැටලු විසඳීමේ යාන්ත්‍රණය තුළ කමිටු ක්‍රියාකාරීත්වය

ග්‍රාම නිලධාරී මහතාගේ සභාපතීත්වයෙන් යුත් කමිටුව විසින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ලැබෙන පැමිණිලි හා ගැටලු දෙසතියක් තුල විසඳනු ඇත.


ඉහත කමිටුවෙන් විසඳිය නොහැකි ගැටලු ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතීත්වයෙන් යුත් ප්‍රා:ලේ කාර්යාල මට්ටමේ ගැටලු විසඳීමේ කමිටුව වෙත ඉදිරිපත්කර සතියක් තුල විසඳනු ඇත.

එසේත් විසඳිය නොහැකි ගැටලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යාලය මට්ටමින් ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ සභාපතීත්වයෙන් යුත් ව්‍යාපෘති මට්ටමේ ගැටලු විසඳීමේ කමිටුව වෙත ඉදිරිපත්කර සතියක් තුල විසඳනු ඇත.

එසේත් විසඳිය නොහැකි ගැටලු වේ නම් ඒවා ජාතික මට්ටමේ ඇති වැඩසටහන් අධ්‍යක්ෂකගේ සභාපතීත්වයෙන් යුත් ගැටලු විසඳීමේ කමිටුව වෙත යොමුකර අමාත්‍යංශ ලේකම්ගේ උපදෙස් මත විසඳුම් ලබාදේ. මෙම සම්පූර්ණ ක්‍රියාදාමය සති හතරකින් නිම කිරීමට අපේක්ෂිතයි.

**සියලුම ගැටලු හා පැමිණිලි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ වාර්තාගත වේ.**

## ගැටලු විසඳීමේ ක්‍රමවේදය




## ගැටලු විසඳීමේ කමිටු හා සාමාජිකයින්

### ග්‍රාම නිලධාරී මට්ටමින් ගැටලු විසඳීමේ කමිටුව

01. ග්‍රාම නිලධාරී (සභාපති)
02. ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ නිලධාරී, පරිසර නිලධාරී
03. ප්‍රජා නියෝජිතයින් හා නායකයින්
04. අදාල අනෙකුත් නිලධාරීන්

අදාල වසමේ ග්‍රාම නිලධාරීගේ කැඳවීම මත මෙම ගැටලු විසඳීමේ කමිටුව රැස්වී ඉදිරිපත්වන ගැටලු සඳහා විසඳුම් ලබාදේ. මෙවැනි කමිටු ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් රැස්වේ.

### ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මට්ටමින් ගැටලු විසඳීමේ කමිටුව

01. ප්‍රාදේශීය ලේකම් (සභාපති)
02. ප්‍රාදේශීය සභාවේ ලේකම්
03. ග්‍රාම නිලධාරීන්
04. ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ නිලධාරී, පරිසර නිලධාරී
05. අදාල අනෙකුත් රේඛීය ආයතනවල නියෝජිතයින් (අවශ්‍යතාවය මත සහභාගීත්වය සඳහා දැනුම්දෙනු ඇත.)

ප්‍රාදේශීය ලේකම්ගේ කැඳවීම මත රැස්වන මෙම කමිටුවට ප්‍රා:ලේ කොට්ඨාසයේ සියලුම ග්‍රාම නිලධාරීන්ද සහභාගි වී ඉදිරිපත් කරන ගැටලු සඳහා විසඳුම් ලබාදේ.